සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

01 ශ්‍රී ලංකාවේ කුඩාම පරිපාලන ඒකකය ............................................... වේ. (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය / ග්‍රාම නිලධාරී කොට්ඨාසය / දිස්ත්‍රික්කය)

02. රජය මැදිහත්වී සහනදායී මිලකට ලබාදෙන සේවාවක් ලෙස .................................. ලබාදීම දැක්විය හැකිය. (ආහාර / ඇඳුම් / ඖෂධ)

03. තායිවාන දූපත පිහිටා ඇත්තේ ................................................ සාගරයේ ය. (පැසිපික් / ආක්ටික් / ඇන්ටාර්ක්ටික්)

04. අධික සූර්ය තාපයත්, උෂ්ණත්වයත් ලැබෙන විට ....................................... කාලගුණික තත්වයක් ඇති වේ. (සෞම්‍ය / වියළි / ශීත)

05. තැනිතලා ප්‍රදේශවල ...................................................... වගාව බහුලව ව්‍යාප්ත වී ඇත. (පොල් / රබර් / තේ)

- අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. රටක නිරපේක්ෂ පිහිටීම යනු එම රට අවට පිහිටි රටවල්, මහද්වීප, මුහුදු හා සාගරවල පිහිටීම සමඟ සම්බන්ධ කර හඳුනා ගැනීමයි. (..........)

07. ඉන්දියානු උප මහාද්වීපයේ සිට හමා එන වියළි සුළංවල බලපෑම නිසා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ උෂ්ණත්වය ඉහළ ගොස් ඇත. (..........)

08. ජන සංඛ්‍යාව අඩුවීමත්, ඉඩකඩ අසීමිත වීමත් නිසා නාගරික පරිසරය තුළ අපද්‍රව්‍ය බැහැර කිරීම ගැටළුවක් නොවේ. (..........)

09. අප රටේ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානය වන්නේ කොළඹ නගරයයි. (..........)

10. වර්ෂාව ඇතිවීමට පෙර අහසෙහි ඝන වළාකුළු දක්නට ලැබේ. (..........)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර පහත දක්වා ඇති ඒවා අතුරින් තෝරා නිවැරදි ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියේ දක්වා ඇති තිත් ඉර මත ලියන්න.**

| | | | |
|---|---|---|---|
| A - සැල්වීනියා | B - කබරගොයා | C - ගෙම්බා | D - බිගෝනියා |
| E - ගවයා | F - ඌරා | G - අවිච්චියා | H - ඇටිකුකුළා |

11 ගොවිතැනට උපකාරී වනවා මෙන්ම නිවසට අදායමක් ද ගෙනදෙන සත්වයෙකි. (............)

12 නීතිය මගින් ආරක්ෂා කරන සතෙකි. (............)

13 බලශක්තිය නිපදවීම සඳහා යොදාගත හැකිය. (............)

14 කාලගුණ අනාවැකි පලකරන සත්වයෙකි. (............)

15 සංචාරක පක්ෂියෙකි. (............)

- **අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16 ශාක වර්ධනයට අවශ්‍ය වන වායුවක් වන්නේ පහත ඒවායින් කුමක් ද?

(1) ඔක්සිජන් (2) නයිට්‍රජන් (3) හීලියම් (4) ආගන්

17 ශ්‍රී ලංකාවේ ඌව පළාතට අයත්වන දිස්ත්‍රික්ක දෙක තෝරන්න.

(1) බදුල්ල, මොණරාගල (2) ගාල්ල, මොණරාගල

(3) අම්පාර, මඩකලපුව (4) බදුල්ල, නුවරඑළිය

18 ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් බහුල වශයෙන් භාවිතා කරනුයේ පහත සඳහන් කුමන කාර්යය සඳහා ද?

(1) ආහාර පිළියෙල කිරීමට (2) ආලෝකය ලබා ගැනීමට

(3) රථ වාහන ධාවනයට (4) පවිත්‍රතා කටයුතු සඳහා

19 අවට වටපිටාවේ භූ දර්ශනය තුළ මිනිසා විසින් නිර්මාණය කරන ලද ලක්ෂණය දක්වෙන පිළිතුර කුමක් ද?

(1) ගංගා (2) උස්බිම් (3) පහත්බිම් (4) වගාබිම්

20 පහත සඳහන් ගංගා අතුරින් ඉන්දියාවේ පිහිටා ඇති ගංගාව කුමක් ද?


(1) සින්දු ගඟ (2) මහවැලි ගඟ

(3) ගෝදාවරී ගඟ (4) නයිල් ගඟ

සැලකිය යුතුයි

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

(01) පහත දැක්වෙන සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(අ) (i) ඉහත සිතියමේ A, B හා C අක්ෂරවලින් දක්වා ඇති රේඛා නම් කරන්න. (ල.03)

(ii) D අක්ෂරයෙන් දක්වා ඇති බොක්ක නම් කරන්න. (ල.01)

(iii) E අක්ෂරයෙන් දක්වා ඇති දූපත නම් කරන්න. (ල.01)

(iv) ශ්‍රී ලංකාවට බටහිරින් පිහිටි F අක්ෂරයෙන් දැක්වෙන මහද්වීපය නම් කරන්න. (ල.01)

(v) ශ්‍රී ලංකාවට දකුණින් පිහිටා ඇති සාගරය කුමක් ද?(ල.01)

(ආ) පහත දැක්වෙන ඡේදය කියවා හිස්තැන්වලට ගැලපෙන පිළිතුර ලියන්න.

ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ඉන්දියාවට (i) ................. දූපතක් වශයෙනි. එය ලෝකයේ විශාලතම මහාද්වීපය වන (ii) ................. මහාද්වීපට අයත් වේ. ඉන්දියාව ශ්‍රී ලංකාවෙන් වෙන් වන්නේ (iii)................... kmක් තරම් වූ පටු මුහුදු තීරයකිනි. එය (iv) .................. නමින් හඳුන්වයි. (ල.04)

(ඉ) ශ්‍රී ලංකාවේ පිහිටි වැදගත් ස්ථාන කිහිපයක් A තීරුවේ ද එම ස්ථාන වැදගත්වීමට හේතුව B තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව යා කරන්න. (ල.05)

| A තීරුවේ | B තීරුවේ |
|---|---|
| 1. හම්බන්තොට | • හිතකර දේශගුණය |
| 2. අනුරාධපුරය | • ස්වාභාවික වරාය |
| 3. නුවරඑළිය | • ලන්දේසි බලකොටුව |
| 4. ත්‍රිකුණාමලය | • මෑතකදී ඉදිකල ජාත්‍යන්තර වරාය |
| 5. ගාල්ල | • ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම |
| | • ප්‍රධාන පරිපාලන නගරය |

(02) පහත රූප සටහන්වල දැක්වෙන්නේ විවිධ ප්‍රදේශවල කාලගුණික තත්ව හතරකි. එම රූප සටහන් උපයෝගී කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


A


B


C


D


(i) රූප සටහනේ A, B, C, D යන අක්ෂර වලින් දැක්වෙන කාලගුණික තත්වයන් මොනවාදැයි පිළිවෙලින් ලියන්න. (ල.04)

(ii) කාලගුණික අංග සහ ඒවා මැනීමට යොදාගන්නා උපකරණ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.05)

| | කාලගුණික අංගය | මනින උපකරණය |
|---|---|---|
| 1. | ........................................ | උෂ්ණත්වමානය |
| 2. | වර්ෂාපතනය | ........................................ |
| 3. | සුළගේ වේගය | ........................................ |
| 4. | සුළගේ දිශාව | ........................................ |
| 5. | ........................................ | නිරීක්ෂණය කිරීමෙන් |

(iii) කාලගුණික තොරතුරු දැන ගැනීමෙන් මිනිසාට ලබාගත හැකි ප්‍රයෝජන 02 ක් ලියන්න. (ල.02)

(03) වර්ෂාපතනය ඇතිවන ආකාරය දැක්වෙන පහත රූප සටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ඉහත රූප සටහනේ A, B හා C අක්ෂර වලින් දැක්වෙන ක්‍රියාවලීන් තුන නම් කරන්න. (ල.03)

(ii) (a) රූප සටහනේ D වලින් දැක්වෙන අංගය නිර්මාණය වන ආකාරය ලියන්න. (ල.03)


(b) වර්ෂාව ඇතිවීමට පෙර D වල ඇති වර්ණය කුමක් ද? (ල.01)

(iii) වර්ෂාවෙන් ලැබෙන ජලය හිඟවීමෙන් ඇතිවිය හැකි ගැටළු දෙකක් ලියන්න. (ල.04)

(04) (i) මිනිසා විසින් භූමිය සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගන්නා අවස්ථා කීපයක් පහත රූප සටහන්වල A, B, C ලෙස දැක්වේ. එම අවස්ථා පිළිවෙලින් නම් කරන්න. (ල.03)


A


B


C


(ii) තම නිවස අවට භූමිය විධිමත්ව පරිහරණය කිරීම සඳහා අනුගමනය කළ යුතු කරුණු 03 ක් ලියා දක්වන්න. (ල.03)


(iii) මිනිසා විසින් භූමිය අවිධිමත් ලෙස පරිහරණය කරන ආකාර කිහිපයක් 'අ' තීරුවේද ඉන් ඇතිවන ප්‍රතිවිපාක කිහිපයක් 'ආ' තීරුවේද දක්වා ඇත. 'අ' තීරුවට ගැලපෙන නිවැරදි පිළිතුර 'ආ' තීරුවෙන් තෝරා එහි අක්ෂරය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න. (ල.05)

| අ තීරුවේ | | ආ තීරුවේ |
|---|---|---|
| 1. කෘෂි බිම් ව්‍යාප්ත කිරීම | (.......) | A - නායයෑම |
| 2. මැණික් සඳහා පොළව කැපීම | (.......) | B - ගංවතුර |
| 3. කඳු බෑවුම් වල වගා කිරීම | (.......) | C - ජලය අපවිත්‍රවීම |
| 4. ගංගාවල වැලි ගොඩ දැමීම | (.......) | D - සත්ව වාසස්ථාන විනාශ වීම |
| 5. පළිබෝධ නාශක භාවිතය | (.......) | E - නියඟය |
| | | F - පාංශු ඛාදනය |


(05) දෛනිකව විවිධ කාර්යයන් සඳහා මිනිසා විසින් විවිධ බලශක්ති ප්‍රභවයන් භාවිතා කරයි.

(i) (a) පහත රූපසටහන්වල විවිධ කාර්යයන් සඳහා භාවිතා කරන බලශක්ති ප්‍රභවයන් දෙකක් A හා B අක්ෂරවලින් දක්වේ. ඒවා පිළිවෙලින් නම් කරන්න. (ල.02)


A


B

(b) බලශක්තිය අපතේයෑම වලක්වා ගැනීම සඳහා භාවිතා කරන උපකරණයක් C අක්ෂරයෙන් දක්වේ. එය නම් කරන්න. (ල.01)


C

(ii) (a) ඉහත A රූප සටහනේ දක්වෙන බලශක්තිය නිපදවීම සඳහා නිවසේ දී යොදාගත හැකි ද්‍රව්‍ය 02 ක් ලියන්න. (ල.02)

(b) B අක්ෂරයෙන් දක්වෙන බලශක්ති ප්‍රභවයේ වාසියක් හා අවාසියක් ලියන්න. (ල.02)


(iii) වර්තමාන බලශක්ති ඉල්ලුම ඉහළ යාමට බලපා ඇති සාධක 02 ක් ලියන්න. (ල.04)

(06) (i) රූප සටහන්වල දැක්වෙන සත්ව වර්ග හා බෝග වර්ග වගාකරන ප්‍රදේශ A, B, C, D අනුපිළිවෙලට ලියා දක්වන්න. (ල.04)

A



C



D




B



(ii) ඔබ ප්‍රදේශයේ පහත සඳහන් අමුද්‍රව්‍ය යොදාගෙන සිදුකරනු ලබන නිෂ්පාදන කර්මාන්ත 01 බැගින් ලියන්න. (ල.02)

(i) මැටි - (ii) සිමෙන්ති -

(iii) පාරම්පරික ශිල්ප ඥානය මත පදනම් වූ කර්මාන්ත ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.05)

| කර්මාන්තය | ව්‍යාප්ති ප්‍රදේශය |
|---|---|
| වෙස් මුහුණු | 1. ............................ |
| 2. ............................ | රදාවඩුන්න |
| පැදුරු | 3. ............................ |
| 4. ............................ | පිළිමතලාව |
| ලී බඩු | 5. ............................ |


(07) පහත දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>පහළට</u> -

1. ශ්‍රී ලංකාවේ ඓතිහාසික නගරයකි.
4. මැලේරියාව ඩෙංගු වැනි රෝග බෝ කරයි.
5. පරිසරයට මුදාහරින දිරාපත් නොවන ද්‍රව්‍යයකි.
6. උතුරු හා නැගෙනහිර දිශාව අතර පිහිටයි.
7. විවිධ මානුෂ ක්‍රියාකාරකම් නිසා දූෂණය වේ.

<u>හරහට</u> -

1. වායු දූෂණය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵලයකි.
2. කුඹුරුවලට හානි කරන සතුන් විනාශ කරයි.
3. වයඹ පළාතට අයත් දිස්ත්‍රික්කයකි.
5. කොළ රොඩු වලින් සාදාගත හැකිය.
8. සේවාවකි.
9. ලෝකයේ විශාලතම දූපත.




(ල. 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ග්‍රාම නිලධාරී කොට්ඨාශය (02) ඖෂධ (03) පැසිපික් (04) වියළි (05) පොල් (06) ✗
(07) ✓ (08) ✗ (09) ✓ (10) ✓ (11) ගවයා (12) කබරගොයා (13) සැල්වීනියා
(14) ගෙම්බා (15) අවිච්චියා (16) 2 (17) 1 (18) 3 (19) 4 (20) 3

(2 x 20 = ල. 40)

## II කොටස

01 (අ) (i) A - මකර නිවර්තනය B - සමකය C - කර්කටන නිවර්තනය (ල.03)
(ii) බෙංගාල බොක්ක (ල.01) (iii) මැඩගස්කරය (ල.01) (iv) අප්‍රිකාව (ල.01)
(v) ඉන්දියන් (ල.01)
(ආ) (i) දකුණින් (ii) ආසියා (iii) 32 (iv) පෝක් සමුද්‍ර සන්ධිය (ල.04)
(ඉ) 1. මැතකදී ඉදිකල ජාත්‍යන්තර වරාය 2. ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම
3. හිතකර දේශගුණය 4. ස්වභාවික වරාය
5. ලන්දේසි බලකොටුව (ල.05)

02 (i) A - වැසිබර B - උණුසුම් C - සීතල හා මීදුම D - සුළං (ල.04)
(ii) 1. උෂ්ණත්වය 2. වර්ෂාමානය 3. අනිලමානය 4. සුළං දිශා දර්ශකය 5. වළාකුළු (ල.05)
(iii) ● එදිනෙදා කටයුතු මනාව සංවිධානය කරගත හැකිය. ● ස්වාභාවික ආපදාවලින් ජීවිත හා දේපල හානි වළක්වා ගත හැකිය. ● ධීවරයින්ට හා ගොවීන්ට ඔවුන්ගේ කටයුතු සාර්ථක කර ගත හැකිය. (ල.02)

03 (i) A - වාෂ්පීකරණ B - උත්ස්වේදනය C - මතුපිට ගලා යාම (ල.03)
(ii) (a) ජලවාෂ්ප ඝණීභවනය වීමෙන් (ල.03) (b) අඳුරු පැහැති ඝණ වලාකුළු (ල.01)
(iii) පානීය ජලය හිඟ වීම / ජල විදුලි බල නිෂ්පාදනය අඩාල වීම / ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක් වීම / කෘෂිකාර්මික හා කාර්මික කටයුතු අඩාල වීම / ලෙඩ රෝග ව්‍යාප්තවීම / පස නිසරු වීම (ල.04)

04 (i) A - කෘෂි කර්මය සඳහා B - කර්මාන්තශාලා ඉදිකිරීම C - වාරිමාර්ග කටයුතු සඳහා (ල.03)
(ii) පස සෝදායන ස්ථානවල කාණු කැපීම / ආවරණ බෝග වැවීම / ගල් වැටි දැමීම / දිනපතා කොහුබත් වැනි වැස්මක් යෙදීම / කොම්පෝස්ට් වලක් සෑදීම (ල.03)
(iii) 1. - D 2. - A 3. - F 4. - B 5. - C (ල.05)

05 (i) (a) B - සූර්යකෝෂ A - ජීව වායුව (ල.02)
(b) C ආලෝක විමෝචන ඩයෝඩය (LED බල්බය) (ල.01)
(ii) (a) මුළුතැන්ගෙයි ඉවතලන අපද්‍රව්‍ය / සැල්වීනියා, දිය හබරල, ග්ලිරිසීඩියා, පිදුරු, ගොම (ල.02)
(b) වාසි - පරිසරයට හානියක් නොමැති වීම / අවාසි - දැරීමට සිදුවන වියදම අධිකයි.
(iii) ජන සංඛ්‍යාව වැඩිවීම / පාරිභෝගික අවශ්‍යතා ඉහල යාම / කාර්මික කටයුතුවල වර්ධනය / ප්‍රවාහන දියුණුව / ජීවන තත්වය උසස්වීම (ල.04)

06 (i) A - තෙත් කලාපය B - වියළි කලාපය C - වෙරළ තීරය D - කඳුකර කලාපය (ල.04)
(ii) ● මැටි - වළං, උළු, ගඩොල් ● සිමෙන්ති - සිමෙන්ති ගල්, මල්පෝච්චි (ල.02)
(iii) 1. අම්බලන්ගොඩ 2. වේවැල් භාණ්ඩ 3. දුම්බර 4. පිත්තල භාණ්ඩ 5. මොරටුව (ල.05)

07 <u>පහලට</u> -
1. අනුරාධපුරය 4. මදුරුවා 5. පොලිතින් 6. ඊසාන 7. වාතය
<u>හරහට</u> -
1. අම්ල වැසි 2. බත්කුරා 3. පුත්තලම 5. පොහොර 8. ප්‍රවාහනය 9. ග්‍රීන්ලන්තය